**12 ශ්‍රේණිය - ගිණුම්කරණය - සති පාසල - 1 වන සතිය - මැයි 4,5 හා 6 දින සඳහා**

**නිෂ්පාදන ගිණුම්**

**හැඳින්වීම**

භාණ්ඩ මිළට ගෙන විකුණන ව්‍යාපාර වර්තමානයේ බොහෝමයක් දැකිය හැකි අතර මෙවැනි ව්‍යාපාරවල ලා/ලා සොයන ආකාරය පිළිබඳ කලින් ඉගෙන ගෙන ඇත.ඒ අනුව ආදායම් ප්‍රකාශයක් පිළියෙල කිරීමෙන් දළ ලාභය හා ශුද්ධ ලාභයද ගණනය කර ඇත.නමුත් ඇතැම් ව්‍යාපාර තම ව්‍යාපාරය තුළම භාණ්ඩ නිෂ්පාදනය කර අලෙවි කිරීමේ කටයුතුවල නියැලෙන අතර තවත් ව්‍යාපාර භාණ්ඩ නිෂ්පාදනය කර අලෙවි කරනවාට අමතරව බාහිරින් නිමි භාණ්ඩ මිළට ගෙන අලෙවිකිරීමේ කටයුතුවල නියැලී සිටී.මෙවැනි ව්‍යාපාරවල භාණ්ඩ නිෂ්පාදනයක් කරන නිසා භාණ්ඩවල විකුණුම් මිළ තීරණය කිරීමට පෙර භාණ්ඩ නිෂ්පාදනය සඳහා වැය කරන ලද වියදම් ප්‍රමාණය නැතහොත් නිෂ්පාදන පිරිවැය ගණනය කළ යුතු වේ.ඊට හේතුව නිෂ්පාදනය කිරීමේ පිරිවැය ගණනය කිරීමෙන් තොරව නිෂ්පාදනය කරන භාණ්ඩයක විකුණුම් මිළ තීරණය කිරීමට නොහැකි බැවිනි.

බාහිරින් මිළදී ගන්නා නිමි භාණ්ඩවල ගැනුම් මිළ ස්ථිර වශයෙන් ම දැකගත හැකි නිසා එම භාණ්ඩ විකිණීමේදී එහි පිරිවැය පහසුවෙන් හඳුනා ගැනීමටත් ගණනය කිරීමටත් හැකිය.නමුත් භාණ්ඩ නිෂ්පාදනය සිදු කරන ව්‍යාපාරයක එහි පිරිවැය නිවැරදිව ගණනය කිරීම අත්‍යාවශ්‍ය කාරණයක් වන අතර මේ සඳහා ව්‍යාපාරය විශේෂිත ප්‍රකාශයක් පිළියෙල කරයි.එය නිෂ්පාදන පිරිවැය ලේඛනය නම් වේ.

**නිෂ්පාදන ගිණුමක් පිළියෙල කිරීමේ අවශ්‍යතාව**

- මුළු නිෂ්පාදන පිරිවැය සෙවීම
- නිෂ්පාදන පිරිවැය පාලනය කිරීම
- නිෂ්පාදනය පිළිබඳ තීරණ ගැනීම

**නිෂ්පාදන පිරිවැය මූලිකාංග**

- ප්‍රාථමික පිරිවැය
- නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය ලෙස නම් කරයි.

**ඍජු ද්‍රව්‍ය පිරිවැය**

නිෂ්පාදනයට ඍජුව අදාළ නිෂ්පාදන ඒකක සමඟ පැහැදිලිව වෙන් කර හඳුනා ගත හැකි ද්‍රව්‍යවලට වැය වූ පිරිවැයයි.
නිදසුන් - ලී බඩු නිපදවන ආයතනයක- දැව
ඇඳුම් මැසීමේ ආයතනයක -රෙදි

**ඍජු ශ්‍රම පිරිවැය**

නිෂ්පාදන ඒකක සමඟ පැහැදිලිව වෙන් කර හඳුනා ගත හැකි නිෂ්පාදිත සැකසීමට ඍජුව දායකවන ශ්‍රමිකයන් වෙනුවෙන් දරන වැටුප් පිරිවැය
නිදසුන් - ලී බඩු නිෂ්පාදන - වඩු කාර්මික වැටුප

ඇඟළුම් කම්හලක - ඇඳුම් මසන්නාට ගෙවූ වැටුප

**<u>සෘජු වෙනත් වියදම්</u>**

නිෂ්පාදිත ඒකකයන් සමඟ පැහැදිලිව වෙන් කර,හඳුනා ගත හැකි,ද්‍රව්‍ය හා ශ්‍රමය නොවන වෙනත් වියදම් සෘජු වෙනත් වියදම් වේ.
නිදසුන් - මෝස්තර නිර්මාණය කිරීමේ වියදම
නිෂ්පාදන ඒකක අනුව ගෙවන පුරස්කාර

නිෂ්පාදන ව්‍යාපාරයක පහත දැක්වෙන තොග දැකිය හැකිය.

- අමු ද්‍රව්‍ය තොගය
- නොනිමි තොගය
- නිමි තොගය

- නොනිමි තොගය සඳහා ප්‍රාථමික හා නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය ඇතුළත් වී ඇතැයි සලකා නිෂ්පාදන පිරිවැයට ගැලපුම් කරනු ලැබේ.